සැ. යු. - 2021.10.29 දින පළ වූ අංක 2252 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,253 - 2021 නොවැම්බර් මස 05 වැනි සිකුරාදා - 2021.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 572 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 575 |


*සැ. යු.*- (i) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2021 ඔක්තෝබර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) නැගිටිමු නැගෙනහිර සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ඔක්තෝබර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) හෙක්ටර් අප්පුහාමි හෙල්පින් හෑන්ඩ් පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ඔක්තෝබර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 නොවැම්බර් මස 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 නොවැම්බර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ඇඹිලිපිටිය දිසා අධිකරණයේ දී ය

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල් සී,
බෑන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

නඩු අංකය : CHC/270/2018/MR

...................*පැමිණිලිකරු.*

*එදිරිව*

වෙල්ලප්පිලි ආරච්චිගේ ධර්මදාස,
''වෙල්ලප්පිලි ස්ටෝර්ස්'',
හබරත්තවෙල,
සෙවණගල.

.......................*විත්තිකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙතය.

මෙම නඩුවෙහි වර්ෂ 2020 ක් වූ පෙබරවාරි මස 27 වන දින ඇතුළත් කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, එකී සමථයෙහි එකඟ වන ලද කොන්දේසිවලට අනුකූලව තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කරවීමට යටත්ව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි මෙම නඩුවේ විත්තිකරුට විරුද්ධව පැමිණිලිකරුගේ වාසියට නඩුව තීන්දු කරන ලද හෙයින් ද,

සමස්ථ මුදල වන රු. 13,560,997.49 ක මුදලක් සහ එම මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් මුල් මුදලේ ශේෂය වන රු. 9,106,937.64 ක මුදල මත වර්ෂ 2017 ජූලි මස 01 වන දින සිට වාර්ෂිකව 20% ක අනුපාතයට පොළියක් ද ගෙවීමට ද නියෝග කර ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම එහි ඇති ගොඩනැගිලි ද සමඟ හා ඊට අයත් හෝ අදාල එකී උකස් කරන ලද දේපල මත හෝ ඒ සම්බන්ධයෙන් විත්තිකරුගේ සියළුම ආකාරයේ අයිතීන් ද සමඟ සියළුම ආකාරයේ හිමිකම් අයිතිවාසිකම් සහ අයැදීම් ද සමඟ ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ආර්. යූ. එන්. විජේසුන්දර විසින් ලියා සහතික කළ අංක 08 දරන 2016 අප්‍රේල් මස 29 දින දරන උකස් බැඳුම්කරයට අනුව බැඳී සහ ක්‍රියාවේ යෙදවිය හැකිව පවතින බවට ද, ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා එම උකස් බැඳුම්කරය බලාත්මක කිරීමට පැමිණිලිකරුට හිමිකම ඇති බවට නියෝග කර ඇති හෙයින් ද,

එකී ණයට දුන් හා අත්තිකාරම් දුන් මූලික මුදල, ඒ මත ගෙවිය යුතු පොලිය සහ අයවිය යුතු පිරිවැය මාස දෙකක (02) කාලසීමාවක් තුළ පැමිණිලිකරු වෙත ගෙවන ලෙස විත්තිකරුට අධිකරණය මඟින් නියෝග කරන ලෙස ද, එසේ ගෙවීම් පැහැර හැරිය හොත් වෙන්දේසි කිරීමේ කොන්දේසි මත මෙහි උපලේඛනයේ දැක්වෙන දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියෝග කර ඇති හෙයින් ද,

එලෙස තීන්දු කරන ලද සමථ තීන්දුව ප්‍රකාරව, විත්තිකරු විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාරව මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහ කොළ ආදී සියළු දේ,

**වර්ෂ 2021 ක් වූ දෙසැම්බර් වන මස 02 වන දින පෙ.ව. 10.00 ට** එකී දේපල පිහිටා ඇති ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේදී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුලත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සීමා තුළ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයෙහි පිහිටි කළගෙඩිආර ග්‍රාම නිලධාරී වසමෙහි පල්ලේගම පිහිටි අතුඉරෙව්යාය *නොහොත්* අළුත් වලව්වේ හේන නමැති ඉඩමට බලයලත් මානක එච්. එම්. ඒ. යූ. නවරත්න විසින් මැන සකස් කරන ලද වර්ෂ 2014 අගෝස්තු මස 18 දිනැති අංක 0644 දරන පිඹුර ප්‍රකාර ලොට් 459 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 139 (දැනට පාර සහ එල්බර්ට් වීරසිංහ පදිංචි ඉඩම) ද, නැගෙනහිරට : ලොට් 145 සහ ලොට් 140 ද, දකුණට : ලොට් 140 (දැනට නෙවිල් සෙනරත්ට අයිති ඉඩම), ලොට් 460 (දැනට වික්‍රමසිංහ පදිංචි ඉඩම) ද, බස්නාහිරට : පාර සහ ලොට් 139 ද, යන මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් අට (අ. 01, රූ. 0, පර්. 08) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, පස් සහ අනෙකුත් සියළු දේ ද සමඟ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. ආර්. සී. දිසානායක විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015 මැයි මස 27 දිනැති අංක 7321 දරන විකුණුම්කරයේ විකුණුම්කරුට හිමි වූ සියලු අයිතිවාසිකම් වේ.

ඉහත කී ඉඩම පහත සඳහන් ඉඩමේ නැවත මැනීමකි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොත ගම් පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සීමා තුළ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයෙහි පිහිටි කළගෙඩි ආර ග්‍රාම නිලධාරී වසමෙහි පල්ලේගම පිහිටි අතු ඉරෙව්යාය *නොහොත්* අළුත් වලව්වේ හේන නමැති ඉඩමට වර්ෂ 1963 පෙබරවාරි මස 15 දිනැති අංක 504 දරන නැවත පදිංචි කිරීමේ නියෝගය ප්‍රකාරව අවසාන ගම් පිඹුරු අංක 779 හිමිකම පිඹුරු අංක S 34000 හි කට්ටි අංක 135 හි ලොට් අංක 459 දරන ඉඩමට මායිම්, උතුරට: පාර සහ ලොට් 139 ද, නැගෙනහිරට : ලොට් 145 සහ ලොට් 140 ද, දකුණට : ලොට් 140 සහ ලොට් 460 ද, සහ බස්නාහිරට : පාර සහ ලොට් 139 යන මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් අට (අ. 01, රූ. 0, පර්. 08) ක් විශාල ඉඩම සහ ඊට අයිති සියලු දේ වේ. මෙම ඉඩම ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L75/102 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළට පිවිසීම.*- ඇඹිලිපිටිය සිට සූරියවැව මාර්ගයේ කි. මී. 1/2 ක් පමණ යන විට හමුවන ලියනගම පාරට හැරී කි. මී. 1/4ක් පමණ ඉදිරියට යන විට මාර්ගයේ වම් පස එකී දේපළ පිහිටා ඇත.

ජී. ඒ. ටී. පී. ගුණරත්න,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, ඇඹිලිපිටිය.

වර්ෂ 2021 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
ඇඹිලිපිටිය දිසා අධිකරණයේ දී ය.

11-202

---

**සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරණු ලබන පිස්කල් විකිණීම**

මොණරාගල දිසා අධිකරණයේ දී ය

සෙලාන් බැන්ක් පීඑල්සී,
(පෙර සෙලාන් බැන්ක් ලිමිටඩ් ලෙස හැඳින් වූ),
සෙලාන් ටවර්ස්, අංක 90,
ගාලුපාර, කොළඹ 03.

*...............පැමිණිලිකරු.*

නඩු අංකය : 1411/MB
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 3,082,461.70
ඇස්කීසි අංකය : 12/2001

*එදිරිව*

නීතා විදාන පතිරණගේ,
අංක 38/4, තිස්ස පාර,
මොණරාගල.

*..................විත්තිකරු.*

මොණරාගල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2019 ක් වූ මැයි මස 30 වැනි දින ලබාදෙන ලද නඩු තීන්දුව අනුව, රුපියල් විසිහය ලක්ෂයක (රු. 2,600,000) අදාළ ණය මුදලින් වර්ෂ 2016.04.28 දිනට ගෙවිය යුතු රුපියල් විසි දෙලක්ෂ හැත්තෑ තුන් දහස් නවසිය විසි තුනයි ශත අනූවක (රු.2,273,923.80) මුදලක් සහ එම මුදල මත වර්ෂ 2016.04.28 වන දින දෙපාර්ශවය විසින් එකඟ වී ඇති සියයට දහනමයක (19%) වාර්ෂික පොලී අනුපාතිකයන් මත එන්තරවාසි යවා ඇති 2016.08.25 තෙක් පොළියද ඊට අමතරව විත්තිකාරිය විසින් ලබාගෙන ඇති රුපියල් හත්ලක්ෂ හැටපන් දහසක (රු.765,000) ණය මුදලට අදාළව වර්ෂ 2016.04.28 දිනට ගෙවිය යුතු රුපියල් අට ලක්ෂ අට දහස් පන්සිය තිස් හතයි ශත අසූවක (රු. 808,537.80) මුදලක් සහ එම මුදල මත එදින සිට ඒන්තරවාසි යවා ඇති 2016.08.25 දක්වා සියයට දහසයක (16%) ක වාර්ෂික පොළියක්ද ඊට අමතරව එම මුදල සම්පූර්ණ මුදලට අද ාළ මෙම නඩුව පවරා ඇති වර්ෂ 2016.09.28 දින සිට තීන්දුවේ දිනය දක්වා නෛතික පොළියද එම මුදල අයකර ගැනීම සඳහා පැමිණිල්ල සමග ගොනු කර ඇති 3238 දරන උකස්කරය මත අදාළ දේපල වෙන්දේසිකර පැමිණිලිකරුට අයකර ගැනීම සඳහා ද, දැනටමත් තහනමට ගෙන ඇති මෙහි පහත සඳහන් දේපල පිස්කල් වෙන්දේසියේ විකිණීම සඳහා වර්ෂ **2021 ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පෙ.ව. 11.00** ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුත්තල වැදිරට කෝරළේ අංක 129 බී දරන මොණරාගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුප්පනේ ගමේ පිහිටි බකිනිකොටහේන නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද බිම් කොටසට බලයලත් මිනින්දෝරු බී ජී. සී. පුෂ්පකුමාර විසින් මැන සාදන ලද අංක 1103 සහ වර්ෂ 1998.01.30 වන දින දරන පිඹුරෙහි නිරූපිත ලොට් 7 දරන බිම් කොටස සඳහා මායිම් ඃ උතුරට ඃ ලොට් අංක 08 සහ ලොට් අංක 02 ද, නැගෙනහිරට ඃ ලොට් අංක 06 ද, දකුණට ඃ ගාමිණී විජේතුංග ලෝරන්ස් සහ ඊ. ජේ. පී. සිරිතුංගට අයිති ඉඩමද, බස්නාහිරට ඃ එස්. ප්‍රේමරත්නට අයිති ඉඩමද, යන මායිම් තුළ වූ පර්චස් විස්සක (අ.0, රූ.0, පර්. 20) විශාලත්වයෙන් යුතු ඉඩම සහ එහි පිහිටි සියලු දේද සමග වේ. මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්‍රිරුව A13/29 හි ලියාපදිංචි වී ඇත.

*දේපලට ප්‍රවේශ මාර්ගය.*- මොණරාගල ඔර්ලෝසු කණුව හංදියේ සිට වැල්ලවාය පාරෙන් මීටර් 500 ක් වම් පසින් ඇති වික්ටරි හෝටල් පරිශ්‍රය අසලින් ඇති තිස්ස පාරෙන් මීටර් 350 ක් ගොස් හමුවන T හංදියෙන් වමට මීටර් 150 ක් ගොස් වම් පසින් ඇති අඩි 10 ක් පළල පාරෙන් මීටර් 60 ක් ගියපසු එම පාර අවසානයට වන්නට වම් පසින් මෙම විෂයගත දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. (1) ගැණුම් මිලෙන් 25% (2) පළාත් අධිකාරියේ බදු සඳහා 1% (1) ප්‍රචාරණ වියදම් (4) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද, ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මොණරාගල දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

ප්‍රධාන කළමනාකරු නීති - සෙලාන් බැන්ක් පීඑල්සී,
අංක 90, ගාලු පාර, කොළඹ 03,
011-2456485, 011-2456479

**බී. ඩබ්ලිව්. දයාරත්න,**
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්/
ප්‍රොබෙට් නිලධාරි,
සාමවිනිසුරු,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මොණරාගල.

වර්ෂ 2021 ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින දී ය,

11-286

# විවිධ දැන්වීම්

## වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

එස්. එම්. එම්. මුෂාරාප් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

01. අද්විතීය ප්‍රදේශවල ජාතික හා ප්‍රජා මට්ටමේ සමාජ-ආර්ථික පර්යේෂණ සිදුකිරීම ;

02. ප්‍රජාවට සහ ජාතියට සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති සකස් කිරීමට උපකාරී වන අධ්‍යයන සඟරා, වාර්තා සහ පොත් තුළින් පර්යේෂණ අධ්‍යයනයේ සොයා ගැනීම් බෙදා හැරීම ;

03. විවිධ අංශවල ශාස්ත්‍රීය හා වෘත්තීයවේදීන් සම්බන්ධ කරමින් රටේ ජනතාව අතර අන්තර් ආගමික හා අන්තර් සංස්කෘතික සමගි සබඳතාවක් ඇති කර ගැනීම.

යනාදිය වේ.

එස්. එම්. එම්. මුෂාරාප්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
දිගාමඩුල්ල මැතිවරණ දිස්ත්‍රික්කය.

11-137

---

## සියනෑ කතිකාව නාලක ගොඩහේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ප්‍රේම්නාත් සී. දොලවත්ත වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) ස්ථාවර නියෝගය යටතේ "සියනෑ කතිකාව නාලක ගොඩහේවා පදනම'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* ජීවිතයේ වගකීම දැරීමට අවශ්‍ය දැනුම හා කුසලතාවයන්ගෙන් පිරිපුන් පුරවැසියන් බිහිකිරීමට දායක වීම ;

*(ආ)* ජීවත් වීමට සුරක්ෂිත පරිසරයක්, වඩාත් ඉහළ අගයෙන් යුතු සංස්කෘතියක්, සාහිත්‍යය, කලාව සහ ක්‍රීඩාව ආදී මූලික අවශ්‍යතාවයන්ගෙන් සපිරුණු පවුල් ඒකක ඇති කිරීමට දායක වීම ;

*(ඇ)* රැකියා සපයාදීම, ස්වයං රැකියා අවස්ථා සහ ව්‍යාපාර අවස්ථා වැඩි කිරීම මගින් ග්‍රාමීය ආර්ථිකය වර්ධනය කිරීමට දායක වීම ;

යනාදිය වේ.

ප්‍රේම්නාත් සී. දොලවත්ත,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

11-327

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

### 2021 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **නොවැම්බර්** | 2021.11.05 | සිකුරාදා | 2021.10.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.12 | සිකුරාදා | 2021.10.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.19 | සිකුරාදා | 2021.11.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.26 | සිකුරාදා | 2021.11.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2021.12.03 | සිකුරාදා | 2021.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.10 | සිකුරාදා | 2021.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.17 | සිකුරාදා | 2021.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.24 | සිකුරාදා | 2021.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.31 | සිකුරාදා | 2021.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |

### 2022 වර්ෂය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2022.01.07 | සිකුරාදා | 2021.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.13 | බ්‍රහස්පතින්දා | 2021.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.21 | සිකුරාදා | 2022.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.28 | සිකුරාදා | 2022.01.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.